සංශෝධනයයි

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ I පන්තියේ III ශ්‍රේණියට සීමිත ධාරාව යටතේ බඳවාගැනීම - 2015 (2020)**

රෙජිස්ට්‍රාර් සේවයේ I පන්තියේ III ශ්‍රේණියේ පවතින පුරප්පාඩු 13ක් පිරවීම සීමිත පදනම මත බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය සඳහා 2015.05.26 වැනි දිනට මෙම දෙපාර්තමේන්තුවෙ රෙජිස්ට්‍රාර් සේවයේ II පන්තියේ සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර රෙජිස්ට්‍රාර් ජනරාල්, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, නො. 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල වෙත ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ රෙජිස්ට්‍රාර් සේවයේ I පන්තියේ III ශ්‍රේණිට සීමිත ධාරාව යටතේ බඳවා ගැනීම - 2015 (2020) යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. තවද, ඉල්ලුම්පත්‍රය පිළියෙළ කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදීම අවශ්‍ය වේ.

අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය - 2021.07.19

සටහන .- අයදුම්පත් අතින් ගෙනවිත් භාරදීමට හැකියාවක් නොපවතින අතර ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

**01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමවේදය**

විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයේ ප්‍රතිඵල මත, එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා 40% හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින්ගේ වැඩිම ලකුණු අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ. අයදුම්කරුවන්ගේ සුදුසුකම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලක් විසින් පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ. පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

**02. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි**

i. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතුය.

ii. බඳවා ගනු ලබන නිලධාරීන් එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත් වේ.

iii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 1/2014 අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව තනතුරට බැඳී වසර 5ක් ඇතුළත ලබා ගත යුතුය.

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලටද, බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් කොන්දේසිවලටද ද, මෙම පත්වීම යටත් වේ.

v. රෙජිස්ට්‍රාර් සේවයේ I පන්තිය III ශ්‍රේණියට පත් වී වසර තුනක් (3) ගත වීමට පෙර බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

vi. ඔබ පත්වීම ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍ය වනුයේ, ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍ය වේ.

**03. වැටුප් පරිමාණය**

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන 1 අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 47,615 - 10 x 1335 - 8 x 1630 - 17 x 2170 - 110,895 (SL-1-12016) වේ.

**04. සුදුසුකම්**

පළපුරුද්ද : (අ) රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාරතමේන්තුවේ රෙජිස්ට්‍රාර් සේවයේ II පන්තියේ ස්ථිර කර තිබීම.

(ආ) රෙජිස්ට්‍රාර් සේවයේ II පන්තියේ අවුරුදු 03ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(ඇ) අයදුම්පත් කැඳවන නිවේදනය මගින් නියම කර ඇති දිනට පූර්වාසන්න වසර පහ (5) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වයස අදාළ නොවේ.

**05. කායික යෝග්‍යතාව**

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**06. වෙනත් සුදුසුකම්**

I. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (5) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් 2015.05.26 වැනි දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**07. ලිඛිත විභාගය**

I. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.
II. විභාගය භාෂා ත්‍රිත්වයෙන්ම පවත්වනු ලැබේ.
III. ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.
IV. ලිඛිත විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| ලේඛන ලියාපදිංචි කිරීම හා හිමිකම් ලියාපදිංචි කිරීම | පැය 3.00 | 100 | 40 |
| විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීම | පැය 3.00 | 100 | 40 |

V. විෂය නිර්දේශය

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| ලේඛන ලියාපදිංචි කිරීම හා හිමිකම් ලියාපදිංචි කිරීම | (අ) ලේඛන ලියාපදිංචි කිරීම හා හිමිකම් ලියාපදිංචි කිරීම පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් පනවන ලද නියෝග<br><br>(ආ) ලේඛන ලියාපදිංචි කිරීම හා හිමිකම් ලියාපදිංචි කිරීම පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් විටින් විට නිකුත් කර ඇති චක්‍රලේඛ හා උපදෙස් |
| විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීම | (අ) විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීම පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් පනවන ලද නියෝග<br><br>(ආ) විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීම පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් විටින් විට නිකුත් කර ඇති චක්‍රලේඛ හා උපදෙස් |

**08. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :**

I. ඉල්ලුම්පත්‍රය සෙ.මී. 22-29 ප්‍රමාණයේ A4. කඩදාසිවල සකස් කළ යුතු අතර, 1.0 - 6.0 තෙක් ශීර්ෂ පළමුවන පිටුවටද, ඉතිරිය දෙවන හා තුන්වන පිටුවලටද වන ලෙස ගෙන කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගෙන සකස් කළයුතු අතර ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර සහ අසම්පූර්ණ ඉල්ලම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම්පත්‍රයේ ඡායාපිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

II. අදාළ ඉල්ලුම්පතේ ඉල්ලුම්කරුගේ අත්සන සහතික කිරීම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයෙකු/නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයෙකු විසින්ම සිදුකළ යුතු වේ.

**09. විභාග ගාස්තුව :**

I. විභාග ගාස්තුව රු. 2,000කි.

II. මෙම විභාග ගාස්තුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පළමුව දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ ගිණුම් අංක 7041650 සඳහා බැරකර ලබාගන්නා ලදුපත අයදුම්පත්‍රයෙහි නියමිත ස්ථානයෙහි ඇලවිය යුතුය. මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. ලදුපතෙහි ඡායා පිටපතක් ලඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

සැලකිය යුතුය :

(අ) නිලධාරීන් විසින් සම්පූර්ණ කර ඉදිරිපත් කරන අයදුම්පත් දෙපාර්තමේන්තුවට ලැබුණු දිනයේදීම දින මුද්‍රාව තැබීමත්, අයදුම්කරු විසින් සඳහන් කරන තොරතුරු නිවැරදි බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කිරීමත්, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර සිදුකළ යුතු වේ. එසේ කිරීමට හැකිවන පරිදි අයදුම්පත් නියමිත දිනට පෙර යොමු කිරීම ඉල්ලුම්කරුගේ වගකීම මේ.

(ආ) විභාග ප්‍රවේශපත්‍රය අයදුම්කරුගේ නමින්, අයදුම්කරුගේ කාර්යාලීය ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවනු ලැබේ.

(ඇ) පත්වීම සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවෙකු එම පත්වීම පිරිනමන අවස්ථාවේදී බලපවත්වන රෙගුලාසි හා විධිවිධානයන් යටතේ පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබී නැතැයි සලකනු ලැබුවහොත් හෝ අසතුටුදායක වැඩ හැසිරීම කරන කොටගෙන හෝ පත්වීම නොදීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

(ඈ) කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම පිරවීම හෝ නොපිරවීමද මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

10. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ විධායක නිලධර ගණයට අනුමත බඳවා ගැනීමේ පරිපාටියට හා ඊට සිදුකර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

11. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යංශය.

2021 මැයි මස 21 වැනි දින.

## රෙජිස්ට්‍රාර් සේවයේ I පන්තියේ III ශ්‍රේණියට සීමිත ධාරාව යටතේ බඳවා ගැනීම සඳහා වන තරග විභාගය - 2015 (2020)

| විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය | |
|---|---|

(අදාළ අංකය කොටුව තුළ ලියන්න, සිංහල - 1, දෙමළ - 2, ඉංග්‍රීසි - 3)

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

1.0 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) ..............................................................................................
උදා:- GUNAWARDHANA, M. G. B. S. K.

1.2 මුලකුරු සමග නම : ..............................................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

1.3 මුලකුරුවලින් හැඳින්වෙන නම් : ..............................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.4 මුලකුරුවලින් හැඳින්වෙන නම් : ..............................................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

2.0 සේවා ස්ථානය හා ලිපිනය

2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..................................................
..............................................................................................

2.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) : ..................................................
..............................................................................................

2.3 විභාගයට කැඳවීමේ ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..................................................
..............................................................................................

3.0 ස්ත්‍රී පුරුෂ භාවය

ස්ත්‍රී- 1
පුරුෂ - 2 ☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

4.0 උපන් දිනය : වර්ෂය : [ ][ ][ ][ ] මාසය : [ ][ ] දිනය : [ ][ ]

5.0 අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට වයස : අවු. : [ ][ ] මාස : [ ][ ] දින : [ ][ ]

6.0 ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

7.0

(a)
(i) රාජ්‍ය සේවයේ සේවාවකට මුළින්ම පත් කරන ලද දිනය : ..........

(ii) පත් කරනු ලැබූ සේවය : ..........

(iii) පත්වීම් ලිපියේ අංකය : ..........

(iv) දිනය : ..........

(b)
(i) රෙජිස්ට්‍රාර් සේවය II පංතියට මුළින්ම පත් වූ දිනය : ..........

(ii) පත්වීම් ලිපියේ අංකය : ..........

(iii) දිනය : ..........

(iv) රෙජිස්ට්‍රාර් සේවය II පංතියේ ස්ථිර කරන ලද දිනය : ..........

(c) සේවා කාලය තුළ සිදුවූ විනය කරුණු

| විනය නියෝගය | චෝදනා පත්‍රය අනුව වරද සිදුවූ කාලසීමාව | විනය නියෝගය අඩංගු ලිපියේ අංකය හා දිනය |
|---|---|---|
| | | |
| | | |

(d) චක්‍රලේඛයේ 6 වැනි ඡේදයේ සඳහන් කොන්දේසි ප්‍රකාරව රෙජිස්ට්‍රාර් සේවය II පංතියේ සුදුසුකම් සම්පූර්ණ කළ යුතු 2015.05.26 වැනි දිනට සක්‍රීය සතුටුදායක සේවා කාලය : ..........

8.0 මුදල් කුවිතාන්සිය මනා ලෙස අලවන්න.

| |
|---|
| |

(i) මුදල් ගෙවන ලද බැංකුව හා ශාඛාව : ..........

9.0 අයදුම්කරුගේ සහතිකය :

2015.05.26 වැනි දින පූර්වාසන්නයේ වූ පස් අවුරුද්ද තුළ වේතනාධික සියල්ල මා විසින් උපයාගෙන ඇති බවත් නිවේදනයේ 06 වැනි ඡේදයේ සඳහන් කොන්දේසි අනුව 2015.05.26 වැනි දිනට සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත බවත් මුළු සේවා කාලය තුළ අවවාද කිරීම හැර මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට මා භාජනය වී නොමැති බවත්

ප්‍රකාශ කරමි. තවද, විභාග ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන සියලු විධිවිධානයන්ට මම යටත්වන බවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

.................................................,
අත්සන.

දිනය : ...........................................

සටහන : ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් හෝ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයෙකු ඉදිරිපිටදී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

**අත්සන සහතික කිරීම**

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර් සේවය II පංතියේ නිලධාරියෙකු/නිලධාරිනියක වන ....................................... ................ මහතා/මහත්මිය/මෙනවිය .......................................................................... වැනි දින මා ඉදිරිපිටදී අත්සන් කළ බව සහතික කරමි.

...........................................................,
සහතික කරන්නාගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය : ...........................
නම : .............................
පදවි නාමය : .................................
ලිපිනය : ..........................................

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ......................................................... මයා/මිය/මෙනවිය රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර් සේවය II පංතියේ තනතුරක සේවය කරන බවද, ඉහත දක්වා ඇති කරුණු නිවැරදි වන බවද ......................................... දිනට පූර්වයෙන් වූ පස් අවුරුදු කාලසීමාව තුළ (සේවා හෝ දෙපාර්තමේන්තුමය පරීක්ෂණ සමත්වීමේ කොන්දේසියක් වන වේතනාධික හැර) ඔහුගේ/ඇයගේ වේතනාධික සියල්ල උපයාගෙන ඇති බවද, චක්‍රලේඛයේ 06 ඡේදයට අනුව ..................................... දිනට සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත බවත්, මුළු සේවා කාලය තුළ වරදකට (අවවාද කිරීම් හැර) කිසිම ආකාරයක විනයානුකූල දඬුවමකට ඔහු/ඇය භාජනය නොවූ බවද, අදාළ චක්‍රලේඛයෙහි සඳහන් සියලු රෙගුලාසි ප්‍රකාරව ඔහු/ඇය සම්මුඛ පරීක්ෂණයට පෙනීසිටීමට සුදුසුකම් ලබා ඇති බවද මෙයින් සහතික කරමි.

...........................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නම :
පදවි නාමය :
ලිපිනය :
දිනය :
(නිල මුද්‍රාව යොදන්න :

06 - 281 :